බුදුසරණ
Buddhist Era 2545 Unduwap Full Moon - Thursday December 19, 2002



රන් වැටකින් පිදුම් ලබන ජය සිරි මහ බෝ සමිඳු

## ✤ බුදු වදනෙන් හෙළි වූ දියුණුවේ රහස්

– නෙළුවාකන්දේ ඤාණානන්ද හිමි

බුදු දහම තුළ දක්වෙන හේතු ඵල දර්ශනය ලෞකික – ලෝකෝත්තර දියුණුවට යොදා ගත හැකි ආකාරය පිළිබඳ විමර්ශනයක් උඳුවප් පුර පෝද ධර්ම දේශනාවෙන්. පැතුමෙන් පමණක් ඉටු නොවන ජීවිත සාර්ථකත්වය – ඊට අදාල හේතු විමසා, ඒවා වර්ධනය කර ගැනීමෙන් ලබාගත හැකි බව මෙයින් පැහැදිලි කෙරේ.

## ✤ සිරිලක් අඟන පොබ කළ නළලත රන් තිලකය

– පල්ලේගම සිරිසුමන ධම්මරක්ඛිත සිරිනිවාස හිමි

ශ්‍රී ලාංකික සමාජය තුළ ශාසනික ප්‍රගතියක් ඇති කිරීමට හා ශාසනික වශයෙන් ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දීමට සමත් වූ ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිළිබඳ ඓතිහාසික තොරතුරු රැගත් ලිපියකි.

## ✤ බුදු සමයෙන් හෙළි වන ආර්ථික දර්ශනය

– උඩුපිහිල්ලේ විමලබුද්ධි හිමි

ගිහියාගේ මෙලොව ජීවිතයේ සාර්ථකත්වය සඳහා අවශ්‍ය ආර්ථික ස්ථාවරත්වය ලබා ගැනීමට අනුගමනය කළ යුතු පිළිවෙත පිළිබඳ මග පෙන්වීමක් ඇතුළත් බුද්ධ දේශනාවක් පිළිබඳ විග්‍රහයකි.

## ✤ හිතේ ඇනෙන 'උල්'

– කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

මිනිස් සිතට නිවන් මගෙහි යා නොදී බාධා කරන ක්ලේශ ධර්ම කිහිපයක් පිළිබඳ විමර්ශනයකි. භාවනාවට පිවිසෙන අයට විශේෂයෙන් වැදගත් වන දේශනාවකට අර්ථකථනයකි.

## ✤ බෝසතුන් සමඟ උයන් කෙළියට ගිය රියැදුරා කවුද?

– බේරුවල ඩී. ඒ. කරුණාරත්න

බෝධිසත්වයන් වහන්සේ ගිහිගෙයින් නික්මීමට පෙර – උයන් කෙළියට යද්දී දුටු සතර පෙර නිමිති පිළිබඳ විමසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සැපයූ අප්‍රකට රථාචාර්යවරයා පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමට දරන ප්‍රයත්නයකි.

## ✤ මිනිස්කම බබළවන තිදොර සංවරය

– බී. ඒ. විමලසේන

සසර දුක අවසන් කිරීම සඳහා පමණක් නොව – සදාචාරවත්, සොඳුරු සමාජයක් ගොඩනැගීම සඳහා ද සිත – කය – වචනය පිළිබඳ පුද්ගල ශික්ෂණයෙහි අවශ්‍යතාව.

## ✤ බෝධි රෝපණ පුවත

– ආචාර්ය සිරිපාල මාදුවගේ

ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලංකාවට වැඩම කිරීම පිළිබඳ ඓතිහාසික ශාසනික සිද්ධිය පිළිබඳ විස්තර ඇතුළත් ලිපියකි. මිහිඳු මහ රහතන් වහන්සේ නිසා ලක්දිව ස්ථාපනය වූ බුද්ධ ශාසනය, සංඝමිත්තා මෙහෙණින් වහන්සේගේ පැමිණීමෙන් තවදුරටත් ප්‍රගතියට හා ව්‍යාප්තියට පත් වූ ආකාරය.

## ✤ සාංචි බෞද්ධ කලා මධ්‍යස්ථානය

– පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරා විද්‍යා සහකාර අධ්‍යක්ෂ සිරිසමන් විජේතුංග

උසස් බෞද්ධ කලා නිර්මාණ රැසක් ඇතුළත් භාරතයේ සුප්‍රකට සාංචි බෞද්ධ කලා මධ්‍යස්ථානය පිළිබඳ තොරතුරු මෙම ලිපියට ඇතුළත් වේ.

## අදින් ඇරැඹෙන සිරිපා සමය

– හරිශ්චන්ද්‍ර කහවල
සම්බුදු සිරිපා සටහන් සලකුණු කිරීම පිළිබඳ ඉතිහාසගත පුවත හා ශ්‍රී පාදස්ථානයේ වත්මන් තත්ත්වය පිළිබඳ විස්තරයකි.

## උඳුවප් පෝදා ඇරැඹි සිරිලක මෙහෙණි සසුන

– ඌරුගමුවේ අස්සජී හිමි
උඳුවප් පුර පෝ දිනක සිදු වූ සිරිලක මෙහෙණි සසුන ඇරැඹීමේ ඓතිහාසික සිද්ධිය පිළිබඳ තොරතුරු රැගත් ලිපියකි.

## හෙළදිව කාන්තා ප්‍රදීපය

– පොළොන්නරුවේ ධම්මානන්ද සිල් මාතාව
සංඝමිත්තා මෙහෙණින් වහන්සේ වැඩම කිරීම නිසා – සිරිලක කාන්තා පරපුරට සිදු වූ යහපත. සිරිලක ඉතිහාසය වෙනස් කළ සංඝමිත්තා මහ රහත් චරිතය ගැන විමසුමක්.

## භද්දිය මහ රහතන් වහන්සේ

– මාදම්පේ සරණතිස්ස නාහිමි
'ශ්‍රාවක චරිත' විශේෂාංගය යටතේ බුදුරදුන්ගේ අසූ මහා ශ්‍රාවකයන් වහන්සේ අතරින් එක් ශ්‍රාවක හිමි නමක පිළිබඳ විස්තර ඇතුළත් ලිපියකි.

## කාන්තා කාන්තිය

– මුරුංගාගස්යායේ ඤාණිස්සර හිමි
සංඝමිත්තාගමනය නිසා සිරිලක ඇති වූ කාන්තා ප්‍රබෝධය හා කාන්තා පරපුරෙහි වත්මන් තත්ත්වය පිළිබඳ විමසුමකි.

## අභයගිරිය ස්ථූපය

– නිශාන්ත පීරිස්
'ඉපැරැණි බෞද්ධ සිද්ධස්ථාන' විශේෂාංගය යටතේ බෞද්ධයන්ගේ විශේෂ ගෞරවයකට ලක් වූ අනුරාධපුර 'අටමස්ථාන' නමින් සුප්‍රකට සිද්ධස්ථානවලින් එකක් වූ අභයගිරි චෛත්‍යය පිළිබඳ ඓතිහාසික තොරතුරු රැගත් ලිපියකි.

## රන් වැටකින් පිදුම් ලබන ජය සිරි මහ බෝ සමිඳු

– රුළුපතාවේ ධම්මජෝති හිමි
ශ්‍රී මහා බෝධියේ ඉතිහාසය ගැන සටහනකි. දෙවැනි රන් වැට අරමුදල පිළිබඳ තොරතුරු ද මෙම ලිපියට ඇතුළත් කොට ඇත.

## Sanghamitta Theri's arrival a land mark in Lanka's history

*-by Chandra Edirisuriya*